**සබරගමුව පළාත් සභාව - 2014**

සබරගමුව පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ පිළිබඳව විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නාලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ තත්ත්වාගණනයකළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**02. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 පළාත් සභා අරමුදල**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

**2.2.2 අනෙකුත් ගිණුම්**

සමාලෝචිත වර්ෂයට අදාලව 2015 ජුනි 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විසර්ජන ගිණුම් | 27 | 27 | -- |
| (ii) | ආදායම් ගිණුම් | 01 | -- | 01 |
| (iii) | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 24 | 23 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 04 | 02 |
| (v) | අරමුදල් ගිණුම් | 02 | 02 | -- |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 03 | 03 | -- |
| (vii) | මන්ත්‍රී අත්තිකාරම් ගිණුම් | 02 | 02 | -- |
| | | 65 | 61 | 04 |

**2.2.3 ගණකාධිකරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන මුළු කෙටිකාලීන ආයෝජන අගය නිරූපනය වන ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.3,607,933,537 ක් ලෙස දක්වා තිබුණු අතර, බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ සනාථන ලිපිය අනුව එකතුව රු.3,634,517,344 ක් නියෝජනය කරන ස්ථාවර තැන්පතු 11 ක් සහ එක් ඉතුරුම් ගිණුමක් පවතින බව අනාවරණය වුයෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ කෙටිකාලීන ආයෝජන අගය රු.26,583,807 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ තැන්පතු හා අනෙකුත් වගකීම් යටතේ ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ තැන්පත් ගිණුමේ ශේෂය රු.3,368,665 ක් ලෙස දක්වා තිබුණ ද අදාල, අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව තැන්පතු ගිණුමේ ශේෂය රු.2,670,024 ක් වුයෙන්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු.698,641 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ බදු නොවන ආදායම් යටතේ මූලධන වත්කම් විකිණීමේ ආදායම ලෙස රු.305,025 ක සෘණ ශේෂයක් දක්වා තිබූ අතර මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂාවේ දී රු.322,000 ක් වූ ආදායමින් ආපසු ගෙවීමක් අදාල ආදායම් සංකේතයට හර කර තිබූ බවට අනාවරණය විය. තවද , පළාත් මූල්‍ය රීති 296.1 ප්‍රකාර ආදායමින් ආපසු ගෙවීම් පළාත් ආදායම් ගිණුමට කෙලින්ම හර නොකළ යුතු වුවද, ඊට පටහැනිව ආදායම් සංකේත අංක 20.06.02.01 වත්කම් විකිණීමේ ආදායම යටතේ හර කර තිබුණි.

**2.2.4 නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 01 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.37,457,031 ක් වු අතර, උපයෝගි ලේඛන/වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.37,165,617 ක් වුයෙන් රු.291,414 ක නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.2.5 ලැබිය යුතු ගිණුම්**

ගිණුම් විෂයයන් 02 කට අදාල අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.5,695,950 ක් විය.

**2.2.6 තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දි එළඹ තිබු එකතුව රු.18,549,089 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණය තීරණ වලට අනුකූල නොවු අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | සබරගමුව පළාත් මූල්‍ය රීති සංග්‍රහය | |
| i. | පළාත් මූල්‍ය රීති 113.3.1 | ගොවීන්ට අවශ්‍ය බීජ, පැළ, උපකරණ හා ද්‍රව්‍ය ලබාදීම සඳහා ගොවීන්ගෙන් මුදල් එකතු කිරීමට අදාලව වැලිගෙපොල කෘෂිකර්ම උපදේශක කාර්යාලය විගණනය වෙත ඉදිරිපත් කරන ලද කුවිතාන්සි පොත් පරීක්ෂාවේදී 2014 වර්ෂයට අදාලව රත්නපුර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය වෙත ප්‍රේෂණය කල මුළු මුදල වූ රු.135,948 න් රු.70,337 ක මුදලකට අදාලව කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. | පළාත් මුල්‍ය රීති 118 | කාර්යාලයට ලැබෙන සියළුම මුදල් නියමිත බැංකු ගිණුමේ බැරට තැන්පත් කළයුතු වුවත්, පල්ලේබැද්ද දිසා රෝහල විසින් 2013 හා 2014 වර්ෂයන්හි දී ලද රු.135,171 ක් බැංකු ගිණුමට ප්‍රේෂණය නොකර , අත රඳවා ගෙන වියදම් කර තිබූ අතර, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 36 කදී ලැබුණු එකතුව රු.2,077,121 ක් වූ මුදල් බැංකුගත කිරීමේ දී දින 02 සිට දින 13 දක්වා වූ කාල පරාසයකින් ප්‍රමාද කර බැංකු ගත කර තිබුණි. |
| (ආ) | මුදල් කොමිෂන් සභා ලේකම්ගේ 2014 මාර්තු 27 දිනැති අංක FC/4/2014 දරණ ලිපියේ iv ඡේදය | පුහුණු වැඩසටහන් සඳහා එම විෂය සම්බන්ධයෙන් වගකීම දරණ අදාල අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සම්පත්දායකයින් ලෙස සම්බන්ධ කර ගන්නේ නම් ඔවුන්ට ඒ සඳහා සම්පත්දායක දීමනා ලබාගත නොහැකි වුවද, ඊට පටහැනිව පළාත් සභාවේ දෙපාර්තමේන්තු 04 ක් විසින් 2014 වර්ෂය තුළ දී පවත්වන ලද වැඩසටහන් 88 ක් සඳහා සම්පත්දායක දීමනා ලෙස රු.302,925 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | මහා නගර සහා ආඥා පනතේ 252 අධිකාරියේ 226(5), (6) වගන්ති, නගර සහා ආඥා පනතේ 255 අධිකාරියේ 183(5) වගන්තිය සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172(8), (9) වගන්ති | විධිවිධාන ප්‍රකාරව අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත එකී තැනැත්තා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාල මුදල ගෙවා නොමැති නම් හා අභියාචනාවක් කර නොමැති නම් අදාල තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීම් කර අදාල මුදල් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කළ යුතුය. ඒ ආකාරයට කටයුතු නොකිරීම හේතුවෙන් විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හි දී නිකුත් කළ අධිභාර සහතික වලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිභාර සහතික 22 ක් යටතේ එකතුව රු.2,104,564 ක ප්‍රමාණයක් අයකර ගත යුතුව තිබුණි. |
| (ඈ) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ඊඩී/03/37/6/134 හා 2013 නොවැම්බර් 28 දිනැති 7/2013 දරණ චක්‍රලේඛය | |
| (i) | 7.2 වගන්තිය | පාසල් සිසුන් ඇතුලත් කිරීමේ දී රජයේ අනුමත ගාස්තු හැර වෙනත් කිසිදු මුදලක් දෙමව්පියන්ගෙන් ලබා නොගත යුතු වුවත්, මාවනැල්ල ප්‍රදේශයේ විද්‍යාලයක 2015 වර්ෂයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේ දි එක් සිසුවෙකු සඳහා රු.5,000 බැගින් සිසුන් 305 දෙනෙකුගෙන් රු.1,525,000 ක් ලබාගෙන තිබුණ ද ලදුපත් නිකුත් කිරීමට හෝ බැංකු ගත කිරීමට කටයුතු නොකර අත රඳවාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 14.1.06 වගන්තිය, 14.1.08 වගන්තිය හා 14.1.11 වගන්තිය | ගෙවීම් කිරීමේ දී පොදු 35 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරන ලද වවුචරය විදුහල්පති විසින් අනුමත කර නියෝජ්‍ය විදුහල්පති විසින් සහතික කළයුතු වුවත්, රත්නපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කළාප තුනක පාසල් 04 ක් විසින් අවස්ථා 10 ක දී එකතුව රු.518,388 ක් ගෙවීම් සිදු කිරීමේ දී වවුචර් පිළියෙල කර නොතිබුණු අතර, එකතුව රු.672,526 ක් වූ ගෙවීම් වවුචර් 177 ක් අනුමත කර නොතිබුණි. තවද , එකතුව රු.665,726 ක් වූ ගෙවීම් වවුචර් 176 ක් විදුහල්පති විසින් සහතික කර තිබූ අතර, එකතුව රු.537,275 ක් වූ ගෙවීම් වවුචර් 10 ක් සහතික කිරිමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ඉ) | ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක ආකා/7/3/08 සහ 2013 නොවැම්බර් 14 දිනැති ලිපිය | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගෙවීම් කිරීමට පදනම් කරගෙන තිබූ ආණ්ඩුකාරවර ලේකම්ගේ උක්ත ලිපියට පටහැනි ලෙස සංග්‍රහ කටයුතු, ලිපි ද්‍රව්‍ය සහ ඉන්ධන හා නවාතැන් සඳහා එකතුව රු.84,932 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 මාර්තු 25 දිනැති අංක FC/Scbp/4/2/2014 දරන මුදල් කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය ප්‍රකාර ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2014 වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ පත්‍රිකා හා පොත් මුද්‍රණය සඳහා වැය කිරීම් සිදු නොකළ යුතු වුවත්, ඊට පටහැනිව අත් පත්‍රිකා හා පොත් මුද්‍රණය සඳහා රු.105,500 ක් වැයකර තිබුණි.

(ආ) පළාතේ ඖෂධ නිෂ්පාදනය වර්ධනය කිරීම මගින් පළාතෙන් බැහැරට ඇදී යමින් තිබූ ඖෂධ වියදමින් අවම වශයෙන් සියයට 40 ක් පළාත තුළ රඳවාගැනීම, පළාත් නිමි හා වියළි ඖෂධ අවශ්‍යතාවයෙන් සියයට 75 ක් පමණ පළාත තුළ නිපදවා ගැනීම හා ඉහල ප්‍රමිතියෙන් යුත් අමුද්‍රව්‍ය ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගැනීම මත ප්‍රතිකාර සේවයේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 5.35 ක් වූ රත්නපුර ආයුර්වේද රෝහලේ පවත්වාගෙන යන ඖෂධ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2013 ඔක්තෝබර් 29 දිනැති මුදල් කොමිෂන් සභාවේ අංක FC/SG/4/2/2013 ලිපිය මගින් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර නිසි අනුමැතියකින් තොරව රුපියල් මිලියන 47 ක ඇස්තමේන්තු පිරිවැයක් සහිත රඹුක්කන වල්ගම පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය හා මධ්‍යම බෙහෙත් ශාලාව ඉදි කිරීමට තීරණය කර ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2008 දෙසැම්බර් 31 දිනට අනුමත කර තිබූ සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයට ඇතුලත් නොවන, ප්‍රධාන අමාත්‍ය උපදේශක තනතුරක් සඳහා 2014 මාර්තු 20 දිනැති ආණ්ඩුකාර ලේකම්තුමාගේ අංක ආ.කා./සලේ/2/1 ලිපිය මගින්

2014 අප්‍රේල් 02 දින සිට උපදේශකවරයෙක් පත්කර තිබූ අතර, එදින සිට 2015 පෙබරවාරි මාසය දක්වා දීමනා වශයෙන් එකතුව රු.938,417 ක් ගෙවා තිබුණි.

**03. ආදායම් කළමනාකරණය**

**3.1 පසු ගිය වර්ෂ 05 ක ආදායමේ උපනතිය**

පසුගිය වර්ෂ 05 තුළ දී පළාත් සභාව විසින් එකතු කරන ලද බදු ආදායම සහ බදු නොවන ආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| 2009 | 1,146,644,488 | 271,623,594 |
| 2010 | 1,382,363,156 | 321,209,919 |
| 2011 | 1,943,637,444 | 416,079,145 |
| 2012 | 2,007,749,583 | 496,404,402 |
| 2013 | 2,163,127,945 | 496,000,276 |

පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(අ) සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් විවිධ ආයතන වෙත බදු දී තිබූ ඉඩම් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.18,421,380 ක් වූ දිගුකාලින බදු සහ දඩ මුදල් ද එකතුව රු.4,446,704 ක් වූ වාර්ෂික බදු සහ දඩ මුදල් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාල එකතුව රු.175,984 ක් වූ එලදා බදු ද 2015 ජුලි මස වන විට හිඟව පැවති අතර, ඒ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගේ 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරණ චක්‍රලේඛයේ 07 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද , ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව එකතුව රු.7,137,892 ක් වූ ජල බදු හා දඩ මුදල් ද අයවිය යුතුව පැවතුණි.

(ආ) කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෞද්ගලික ආයතනයක් වෙත 2004 වර්ෂයේ දී බදු දී තිබූ ඉඩමක් වෙනුවෙන් 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා දීර්ඝ කාලීන බදු හෝ වාර්ෂික බදු හෝ අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**04 මූල්‍ය සමාලෝචනය**

**4.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,415,104,004 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,916,626,676 ක් විය.

**4.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 11 කට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පනවා තිබූ නෛතික සිද්ධි 68 ක් සහ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 04 ක් විසින් බාහිර පාර්ශවයන් වෙත පනවා තිබූ නෛතික සිද්ධි 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට විභාග වෙමින් පැවැතුණි.

**4.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම**

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම 2013 වර්ෂයේ තත්‍ය වියදම සමඟ සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 04 කට අදාල තත්‍ය වියදම 2013 වර්ෂයේ වියදමට වඩා සියයට 37 සිට සියයට 635 දක්වා වූ පරාසයකින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

**05. අධිකාරී ගිණුම්**

**සබරගමුව පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2014 ජනවාරි 01 දින සිට අධිකාරියට අයත් වාහන දෙකක් ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරි කටයුතු සඳහා රියදුරන් සමඟ නිදහස් කර තිබුණු අතර, ඒ සඳහා 2014 වර්ෂයේ ඉන්ධන හා නඩත්තු වියදම ලෙස රු.1,997,820 ක් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අරමුදලින් ගෙවීම් කර තිබුණි.

ii. 1994 අංක 01 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 3 (ආ) v වගන්තිය පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයන් ලෙස පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් පත්කර නොතිබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තුන් දෙනෙකු සඳහා දීමනා වලට අමතරව ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් රු.15,000 ක් බැගින් 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා එකතුව රු.285,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

iii. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සුභසාධක කටයුතු වෙනුවෙන් ආරම්භ කර තිබූ අරමුදලේ ව්‍යවස්ථාවක් හා රීති මාලාවක් සකස් කර නොතිබුණි. බස් රථ හිමියන් සඳහා සේවක සුභසාධනය වෙනුවෙන් මෙම අරමුදලින් කිසිදු මුදලක් වැයකර නොතිබුණු අතර, 2013 හා 2014 වර්ෂ දෙක සඳහා ලැබී තිබුණු රු.6,721,543 න් රු.6,559,719 ක් අධිකාරියේ අරමුණු වලින් බැහැර වූ කටයුතු සඳහා යොදවා තිබුණි.

iv. සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හිටපු සභාපතිවරයෙකුට හිමි මගී ප්‍රවාහන බලපත්‍ර ලබාගත යුතු බස්රථ 06 ක් සඳහා කිසිදු බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව හා වාර්ෂිකව අළුත් කිරීමකින් හා මාසිකව ලොග් පත්‍ර ලබා ගැනීමකින් තොරව ධාවනය කර තිබූ හෙයින් 2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ගණනය කළ විට අධිකාරියට රු.723,000 ක පමණ පාඩුවක් සිදු වී තිබුණි. තවද, ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබා දුන් බස්රථ 11 ක් සඳහා මාසික ලොග් පත්‍ර ලබා නොගෙන ධාවනය කර තිබීම හේතුවෙන් 2014 වර්ෂය සඳහා රු.64,150 ක පාඩුවක් සිදු වී තිබුණි.

v. 2013 ජුලි 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය අනුව මාසික රු.150,000 ට වැඩි දඩ මුදල් ආදායමක් ඇති විට පමණක් එයට සියයට 30 ක කොමිස් මුදලක් අදාල මාර්ග පරීක්ෂකවරුන්ට ගෙවිය හැකි වුවත්, ඊට පටහැනි ලෙස 2014 වර්ෂයේ දී එකතුව රු.229,054 ක් කොමිස් මුදල් ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

vi. හිටපු සභාපතිවරයකු වෙත ලබාදුන් ස්ථාවර දුරකථනයේ සම්බන්ධතාවය අත්හිටුවීමට කටයුතු නොකර 2014 පෙබරවාරි සිට 2015 ජනවාරි දක්වා රු.63,995 ක බිල්පත් අධිකාරියේ අරමුදලින් ගෙවීම් කර තිබුණි.

vii. 1994 අංක 01 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන ප්‍රඥප්තිය සමඟ කියවිය යුතු 2001 සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ (පරිපාලන හා මූල්‍ය) රීති වල 02 වගන්තිය පරිදි අධිකාරිය සඳහා පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ අනුමත සේවක සංඛ්‍යාවක් සිටිය යුතු වුවද, 2015 පෙබරවාරි 23 දින දක්වාම සේවක සංඛ්‍යාවන් අනුමත කරගෙන නොතිබුණු අතර, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් ද සකස් කර නොතිබුණි. තවද, සේවක පාලනය හා විනය කටයුතු සඳහා (පරිපාලන හා මූල්‍ය) රීති මාලාවේ 06 වන වගන්තිය පරිදි රීති මාලාවක් සකස් කළ යුතු අතර, ආයතන සංග්‍රහයේ නියමයන් ද අදාල කරගත යුතු බව අවධාරණය කර තිබිය දී කිසිදු විනය ක්‍රියා මාර්ගයකින් තොරව පෞද්ගලික හේතු මත සේවකයන්ගේ වැඩ තහනම් කිරීම නිසා අසාධාරණයට ලක් වූ සේවකයන් කීපදෙනකු නඩු පවරා තිබුණි. එසේ පවරා තිබුණු නඩුවලින් ආයතනය වැරදිකරු වී තිබුණු අතර, එක් නඩුවක් සඳහා නඩු ගාස්තු ලෙස 2014 වර්ෂය සඳහා රු.59,000 ක් අනාර්ථික ලෙස ගෙවීම් කර තිබුණි.

viii. ආයතනයේ ස්ථිර ලිපිකරුවකු 2009 ජුලි 24 දින සිට 2009 නොවැම්බර් 05 දක්වා ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ සේවය සඳහා නිදහස් කර ඔහු වෙනුවෙන් රු.61,412 ක් අධිකාරියේ අරමුදලින් ගෙවීම් කර තිබුණි. එමෙන්ම 2012 නොවැම්බර් 02 දින අධිකාරිය විසින් කාර්යභාර නිලධාරිවරයෙකු ලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු පුද්ගලයෙකු රියදුරුවරයෙකු ලෙස ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරි සඳහා යොදවාගෙන තිබුණු අතර, එදින සිට මසකට රු.12,500 බැගින් එකතුව රු.450,000 ක් අධිකාරියේ අරමුදලින් ගෙවීම් කර තිබුණි.

**06. මෙහෙයුම් සමාලෝචනය**

**6.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද මාතෘ හා ළමා පෝෂණ වැඩසටහන සඳහා ආරම්භයේ සිටම තෝරාගෙන තිබුණේ රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කයේ එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් බැගින් වූ බැවින්, අපේක්ෂිත ප්‍රතිලාභ පළාත තුල බෙදී යාමේ විෂමතාවයක් නිරීක්ෂණය විය. මෙම කරුණ පිළිබඳව ඉකුත් විගණන විමසුම මඟින් ද නිරීක්ෂණ ඉදිරිපත් කලද, ඒ පිළිබඳව කිසිදු අවධානයක් යොමු නොකොට සමාලෝචිත වර්ෂයේදී ද එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි මෙම වැඩසටහන පවත්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදලින් සියයට 31 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) 2014 වර්ෂය වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක කිසිදු ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් නොතිබුණු තත්ත්වයක් තුළ 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වැසී ඇති පාසල් හා ජේෂකර්ම මධ්‍යස්ථාන යොදාගෙන සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් තුළ මධ්‍යම බෙහෙත් ශාලා 05 ක් ඉදිකිරීම සඳහා රු.1,500,000 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද 2014 වර්ෂය තුළ දී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ර/මැද්දකන්ද දෙමළ විද්‍යාලයේ 2013 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදි ගණිතය විෂය සමත් විමේ ප්‍රතිශතය සියයට 40 ක අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණ අතර 7,9 සහ 11 වසර වල වාර විභාග ප්‍රතිඵල අනුව සිසුන්ගෙන් සියයට 70 කට පමණ ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා ලකුණු 30 ඉක්මවීමට නොහැකි වි තිබුණි.

(ඈ) ර/ශ්‍රී /වළගම්බා මහා විද්‍යාලයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ පසුගිය වසර 5 ක ප්‍රතිඵල සමාලෝචනය කිරීමේදී ගණිතය විෂය සියයට 30 සිට සියයට 40 දක්වා ද ඉංග්‍රීසි විෂය සියයට 10 සිට සියයට 27 දක්වා ද , විද්‍යාව විෂය සියයට 44 සිට සියයට 65 දක්වා ද වූ අඩු පරාසයන්ගෙන් සමත් වී තිබුණි.

**6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර නොතිබීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට විනය නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ පළාත් පාලන ආයතනයක සේවයේ නියුතු නිලධාරියෙක් 2014 පෙබරවාරි 19 දින පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ දි සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සිඑම්/ඒඩී/03/02/06 හා 2014 මැයි 12 දිනැති ලිපියේ ඇතුලත් දඬුවම් නියෝගවලට යටත්ව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 2014 ජුලි 11 දිනැති අංක PH/P/2/1571 දරණ ප්‍රධාන ලේකම් ඇමතූ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇතත්, විගණිත දිනය වූ 2015 මාර්තු 23 දින වන විටත් එකී විනය නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2015 අප්‍රේල් 30 දින වන විට පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 08 වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 42 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු.221,382,650 ක් විය.

**6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2014 සංවර්ධන වැඩසටහන යටතේ මහින්දෝදය ඔසු උයන් ව්‍යාපෘතිය වෙනුවෙන් රු.292,000 ක් අනුමත කර තිබූ අතර, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පාසැල් 100 ක් තෝරාගෙන නාම පුවරු හා පැල මිල දී ගැනීමට රු.156,800 ක් වැය කර තිබුණි. මිල දී ගත් පැල හා නාම පුවරු 2015 අප්‍රේල් 07 දින දක්වා පාසැල් වෙත බෙදා හැරීම සිදු කර නොතිබූ අතර එම නාම පුවරු දෙපාර්තමේන්තුවේ ගබඩා කර තිබූ බවත්, මිල දී ගත් පැල සැපයුම්කරුවන් වෙතම රඳවා තිබූ බවත්, විගණනයේ දී අනාවරණය විය.

(ආ) උඳුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ 2015 පෙබරවාරි 25 වන දිනට අලෙවිසැලේ ලේඛන අනුව තිබිය යුතු තොගය භෞතිකව පරීක්ෂා කිරීමේදී, එකතුව රු.42,560ක් වූ තොග අයිතම් හතරක ඌනතාවයක් තිබූ අතර අලෙවිසැලේ තොග නඩත්තුව සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) උඩවලව ප්‍රාදේශීය රෝහලේ එදිනෙදා කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වූ ගොඩනැඟිලි 09 ක් සම්බන්ධයෙන් වූ අලුත්වැඩියා කටයුතු ද යන්ත්‍රෝපකරණ අවශ්‍යතා 04 ක් ද වසර ගණනක සිට අවශ්‍යව පැවති අතර, එම අවශ්‍යතා සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අදාල කටයුතු කිරීමට බලධාරීන් අපොහොසත් වී තිබුණි.

(ඈ) පල්ලේබැද්ද දිසා රෝහලේ 2014 වර්ෂයේ සංවර්ධන සැලැස්මේ ඇතුලත් කර තිබූ අත්‍යවශ්‍ය ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීම්, ජීව වෛද්‍ය උපකරණ හා සායන උපකරන අළුත්වැඩියා කිරීම් හා අළුතින් මිල දී ගැනීම් විගණිත දින වූ 2014 දෙසැම්බර් 10 දින වන විටත් සිදුකිරීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) චන්ද්‍රිකා වැව ප්‍රාදේශීය රෝහල් බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර ඒකකය සහ නේවාසික රෝගී වාට්ටුවල භාවිතා වූ වර්ග 14 කට අයත් වෛද්‍ය උපකරණ 29 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(ඊ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ආරම්භ කර ඇති විනය ලිපිගොනු සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පරීක්ෂා කර බැලීමේ දී, ලිපිගොනු 22 ක පරීක්ෂණ කටයුතු සිදු වීම මන්දගාමී ස්වරූපයක් ගෙන තිබූ බව විගණනයේ දී අනාවරණය විය.

(උ) 2011 ජනවාරි සිට 2013 අප්‍රේල් මාසය දක්වා වූ කාලපරිච්ඡේදයේ විවිධ කාල සීමාවන් තුල දී එවකට සබරගමුව පළාත් සභාවේ වැඩ බලන පළාත් පාලන කොමසාරිස්, ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස සේවය කරන ලද නිලධාරියෙක් පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් නිල නිවසෙහි පදිංචිව සිට ඇති අතර, 2013 අප්‍රේල් 11 දින ස්ථාන මාරු වී ගොස් ඇති නමුත් විගණිත දිනය වූ 2015 මාර්තු 23 දින වන විටත් එකී නිල නිවස විධිමත් පරිදි භාරදීමක් සිදුකර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තාව අනුව එම නිලධාරියා පදිංචිව සිටි කාලයට අදාලව රු.193,256 ක් නිවාස කුලී මුදල් වශයෙන් අය විය යුතුව තිබුණි.

(ඌ) 2002 දෙසැම්බර් 04 දිනැති අංක HRD/PPM/2002/30 දරණ චක්‍රලේඛයෙන් බලාත්මක කෙරුනු අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලට ගැනීම හා බෙදාහැරීම සම්බන්ධ මාර්ගෝපදේශ අත්පොතේ 24.2 ඡේදය හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලද පාසැල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොතේ 15.2 ඡේදය ප්‍රකාරව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප ගණකාධිකාරී, කොට්ඨාශ භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් පාසල් වලට ගොස් නියාමනය කල යුතුව තිබුණි. 2012, 2013 හා 2014 යන වර්ෂයන්ට අදාලව ඇඹිලිපිටිය අධ්‍යාපන කළාපයේ නියාමනය කල පාසල් සංඛ්‍යාව පිළිවෙලින් 30, 29 හා 26 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 24, සියයට 23 හා සියයට 20 ක් විය.

(එ) දෙහිඕවිට කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව සහකාර අධ්‍යක්ෂවරුන් 06 දෙනෙකුගේ 2014 වර්ෂය තුළ දි පාසල් කේවල සමීක්ෂණ කටයුතු සැලසුම් කළ අවස්ථා 392 ක් වුවත් එයින් අවස්ථා 300 ක් සිදුකර නොතිබුණු බව අනාවරණය විය.

(ඒ) පාසල් සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් කෑගල්ල කළාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂවරුන් 15 දෙනෙකුට සහ ගුරු උපදේශකවරුන් 56 දෙනෙකුට වගකීම් පැවරී තිබුණු අතර, 2014

වර්ෂයේ දී පාසල් 76 ක් අධීක්ෂණ කටයුතු සඳහා සැලසුම් පිළියෙල කර තිබුණ ද, පිළිගත හැකි හේතුන් කිසිවක් නොදක්වා පාසල් 23 ක අධීක්ෂණ කටයුතු අත්හැර තිබුණි.

(ඔ) කෑ/මාව/වැගන්තලේ මහා විද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව වට්ටෝරු භාණ්ඩ වර්ග 100 කට අදාල භාණ්ඩ හා උපකරණ ඒකක 360 ක ඌනතාවය සම්බන්ධ වගකිව යුතු තැනැත්තන් හඳුනා ගැනීම පිණිස, පරීක්ෂණ නිලධාරියෙකු 2014 දෙසැම්බර් 07 වැනි දින කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත්කර තිබුණ ද, එවැනි පරීක්ෂණයක් සිදුකළ බවට විගණනයට තොරතුරු ඉදිරිපත් නොවීය. තවද උඩවලව ප්‍රාදේශීය රෝහලේ 2014 ඔක්තෝබර් මස සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පොදු භාණ්ඩ ලේඛනයේ දැක්වෙන උපකරණ වර්ග 07 කට අදාලව ඒකක 27 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඕ) මාවනැල්ල කළාප අධ්‍යාපන කාර්යාලය විසින් නඩත්තු කර තිබූ පෙත්සම් ලේඛනයට අනුව 2011 සැප්තැම්බර් 28 වැනි දින සිට 2014 සැප්තැම්බර් 26 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ පෙත්සම් සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව මූලික විමර්ශන පැවැත්වීම සඳහා පත්කළ නිලධාරීන් විසින් ඔවුන්ට පැවරුණු මූලික විමර්ශන 20 ක් පරීක්ෂණයට භාජනය කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, පාසල් 08 ක සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් ලද පෙත්සම් 08 ක් පිළිබඳව පරීක්ෂා කිරීමට ද පියවර ගෙන නොතිබුණි. තවද, සිදු කරන ලද මූලික විමර්ශනවල චෝදනා සනාථ වූ අවස්ථා 07 ක් සම්බන්ධ මූලික විමර්ශන වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර තිබුණ ද චූදිත නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ සිදුකළ බවට හෝ විනය ක්‍රියාමාර්ග ගත් බවට හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ක) පාසල් සිසුන් සඳහා නොමිලයේ බෙදා දෙනු ලබන පෙළ පොත් 3390 ක් හා ගුරු අත්පොත් 200 ක් බෙදා දීමට කෑ/මාව/සුජාතා කණිෂ්ඨ විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබූ අතර එයින් පෙළ පොත් 330 ක් භාවිතයෙන් ඉවත්වන තෙක්ම ගබඩාවේ රඳවාගෙන තිබූ බව ද නිරීක්ෂණය විය.

(ග) වරකාපොල ප්‍රාදේශීය සභා සීමාවට අයත්, තෝලංගමුව පාලුවත්ත පාර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ රු.87,405 ක මුදල එම කාර්යයට නොයොදා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ච) ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2009 වර්ෂයේ දී ඉඩම් කච්චේරි පවත්වා තිබුණ ද, දීර්ඝ කාලීන බදු ඉඩම් ඉල්ලුම්කරුවන් හඳුනාගෙන ඔවුන්ට දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දී නොතිබුණි. 2013 වසරේ දී තෝරාගත් දීර්ඝ කාලීන බදු ඉල්ලුම්කරුවන් සඳහා අවශ්‍ය කටයුතු සම්පූර්ණ කළ ද , 2014 නොවැම්බර් මස දක්වාත් බදු අයකර නොතිබුණි. ඔවුන්ගෙන් ඇතැම් අය අදාල ඉඩම් භුක්ති විඳින අතර ඒ සඳහා වාර්ෂික බදු අයකිරීමට ද කටයුතු කර නොතිබුණි.

( ජ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පළාත් සභාවට අයත් මුදල් සඳහා වූ බැංකු ගිණුම්වල රු.100,000 ක් රඳවා තබා ඉතිරි මුදල් මාසිකව පළාත් සභාව වෙත ප්‍රේෂණය කරන ලෙස අංක CSAC/AP/04/01 දරණ හා 2007 පෙබරවාරි 22 දිනැති සබරගමුව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය කළමනාකරණ) ගේ ලිපිය මගින් දන්වා තිබුණ ද, රත්නපුර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඊට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් 2013 වසර අවසානයේ දී හා 2014 වසරේ සැප්තැම්බර්, ඔක්තෝබර් හෝ නොවැම්බර් මස

අවසානයේ දි ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි බැංකු ගිණුම්වල එකතුව රු.213,476,616 ක් ශේෂ වී තිබුණි. මේ නිසා පළාතේ සංවර්ධනය වෙනුවෙන් යෙදවිය හැකි මුදලක් කිසිදු පොළියක් ද රහිතව බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පැවැති බව නිරීක්ෂණය විය.

(ට) ඉඩම්, පළාත් වාරි මාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ සිදු වී ඇති වාහන අනතුරු 11 ක් සම්බන්ධයෙන් පළාත් මුල්‍ය රීති 55.2 ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගත යුතු යැයි තීරණය කර තිබූ එකතුව රු.248,720 ක්, අදාල අලාභය සිදුවී වසර 2 සිට වසර 10 දක්වා ඉක්ම ගොස් තිබුණද, අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඩ) සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විෂයයන් 07 ක් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ දී රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත වෙන් කර තිබු රු.6,880,550 ක මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට රු.2,345,022 ක මුදලක් ඉතිරි වී අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ ඒ වැඩසටහන්හි ඉතිරිවීමේ ප්‍රතිශතයන් සියයට 6 සිට සියයට 80 දක්වා වූ අතර, අරමුදල් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගනිමින් නියමිත පරිදි අදාල සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(න) 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 01/2001 දරණ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා මන්ත්‍රිවරුන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරිමට අදාල චක්‍රලේඛයේ 3.1 වගන්තියට අනුව පළාත් සභා මන්ත්‍රිවරයෙකුට ලබා ගත හැකි ණය උපරිම සීමාව රු.250,000 ක් ලෙස දක්වා තිබුණ ද ඊට පටහැනි ලෙස සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සහා ලේකම් කාර්යාලය විසින් එක් මන්ත්‍රිවරයෙකුට රු.500,000 බැගින් ණය ලබා දී තිබු බව විගණනයේදී අනාවරණය විය. තවද, 2014 දෙසැම්බර් 31 දින වන විට ඉහත පරිදි අනුමත සීමාව ඉක්මවා ලබා දී තිබූ ණය මුදලින් 2012 ජුනි 27 දින මන්ත්‍රිධුරය අහෝසි වී ඇති මන්ත්‍රිවරු 12 දෙනෙකුට අදාල එකතුව රු.1,418,600 ක් වූ ණය ශේෂ දිගින් දිගටම අක්‍රියව පවතින බවත් එම ණය මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් විගණනයට අනාවරණය විය.

**6.4 ඖෂධ කළමනාකරණය**
**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උඳුගොඩ දිසා රෝහල හා කෑගල්ල හා වරකාපොල ආයුර්වේද රෝහල් විසින් විධිමත් පරිදි ඖෂධ ගබඩා නොකිරීම හේතුවෙන් ඖෂධවල ආරක්ෂාව හා ගුණාත්මකභාවය අවදානමකට ලක් වී තිබුණි.

(ආ) උඩවලව ප්‍රාදේශීය රෝහලේ අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග 05 කට අදාලව විගණිත දිනය වූ 2014 දෙසැම්බර් මස 09 දින වන විට ප්‍රධාන ඖෂධ ගබඩාවේ තොග ලේඛනය අනුව කිසිදු භෞතික ශේෂයක් නොපැවතුණු අතර, මෙම ඌනතාවයන් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් අංශය වෙත අදාල පරිදි දැනුවත් කිරීම් සිදුකර ඇති බවට අනාවරණය නොවුණි. තවද , නිවැරදි ඖෂධ කළමනාකරන ක්‍රමයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ඖෂධ වර්ග 05 කින් ඒකක 1252 ක් විගණිත දිනවන විට මාස 02 සිට මාස 11 දක්වා වූ කාලපරිච්ඡේදයකින් කල් ඉකුත් වී තිබුණි.

(ඇ) උඩවලව ප්‍රාදේශීය රෝහලේ සහ පල්ලේබැද්ද දිසා රෝහලේ ඖෂධ ගබඩාවන්හි ඖෂධ තොග ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබුණු අතර, උඩවලව ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී අංශයේ තොග ලේඛනයේ

දින දෙකක දී සිදුකරන ලද ඖෂධ නිකුත් කිරීම් වෛද්‍යවරයාගේ බෙහෙත් තුන්ඩු සමඟ සංසන්දනය කිරීමේ දී බෙහෙත් වර්ග 02 ක් සම්බන්ධයෙන් ඒකක 1200 ක් වෛද්‍යවරයා විසින් නිකුත් කර නොතිබුණ ද, ඖෂධ ලේඛනයේ එම දිනයන් යටතේ නිකුත් කිරීම් වශයෙන් දක්වා තිබුණි.

## 6.5 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද මාර්ග අළුත්වැඩියා හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත් පිළිබඳව විගණනය විසින් සිදුකරනලද නියැදි ක්ෂේත්‍ර පරික්ෂාවන්වලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | කර්මාන්තය | ගිවිසුම්ගත වටිනාකම | ක්ෂේත්‍ර පරීක්ෂණ දිනය | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|---|---|
| | | රු. | | |
| i. | කුරුවිට තැඹිලියන මාර්ගය කි.මී.0.00 - කි.මී.1.4 දක්වා අළුත්වැඩියා කිරීම | 1,695,328 | 2014.12.04 | පළමුවර තාර ආලේපනයේ දී සම්මත ප්‍රමාණයේ ගල් භාවිතා නොකිරීම , කාණු සඳහා ඝන මීටර් 31 ක පස් නොකැපීම. |
| ii. | රත්ගඟ පොල්වත්ත මාර්ගය කි.මී.0.00- කි.මී.1.25 දක්වා අළුත්වැඩියා කිරීම | 2,754,493 | 2014.12.09 | එකතුව වර්ග මීටර් 120 ක් මාර්ගයේ මතුපිට පෘෂ්ඨය කැඩී ගොස් තිබීම. |
| iii. | ඕළුගල , දිවුල්පිටිය හරහා ඉළුක්වත්ත මාර්ගය කි.මී. 0.00- කි.මී.0.53 දක්වා නඩත්තු කිරීම | 1,418,638 | 2014.12.09 | පළමුවර තාර ආලේපනය කර තිබූ මාර්ගයේ මීටර් 13 ක් සම්පූර්ණ මතුපිට පෘෂ්ඨය කැඩී තිබීම |
| iv. | පාගොඩ ලුණුවැල්ල මාර්ගය කි.මී.0.00- කි.මී.0.817 දක්වා අළුත්වැඩියා කිරීම | 1,651,908 | 2014.12.09 | දෙවනවර තාර ආලේපය සියයට 15 ක් නිසි ප්‍රමිතියෙන් සිදුකර නොතිබීම. |
| v. | නඩුකාරදෙණිය බන්ධනාගාර මාර්ගයේ පැති බැම්ම ඉදිකිරිම | 1,935,350 | 2014.12.05 | රු.1,085,558 ක් ගෙවීම් කර තිබූ සක්ක බැම්මෙ ස්ථාන 08 ක් පුපුරා තිබීම. |
| vi. | පරකඩුව බැවිල මාර්ගය කි.මී.4.5- කි.මී.6.4 දක්වා අළුත්වැඩියා කිරීම | 8,106,521 | 2014.12.05 | දුර මීටර් 21 ක මතුපිට පෘෂ්ඨය සහ දුර මීටර් 49 ක දෙපස අයින් කැඩී තිබිම සහ බෝක්කුව ඉදිකර තිබූ ස්ථානයේ මාර්ගයේ වර්ග මීටර් 08 ක ප්‍රදේශය සම මට්ටමින් ගිලා බැස තිබීම. |
| vii. | හිරලියැද්ද විහාරස්ථානයේ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 450,000 | 2014.11.11 | මාර්ග තලය මත අඟල් 4 x 4 කළු ගල් යෙදීම සිදුකළ යුතු වුවත්, අඟල් 6 x 9 කලුගල් යොදා තිබීම. |

## 6.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් කොමිෂන් සභා ලේකම්ගේ 2014 ජුනි 04 දිනැති අංක FC/SABP/4/2/2014 දරණ ලිපිය ප්‍රකාර පසුගාමී හා හුදකලා ගම්මාන පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිපාදන වලින් දැනුවත් කිරීමේ

වැඩසටහන්, ඍජු ප්‍රදාන ලබාදීම් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකල යුතු බව දන්වා තිබියදී ඊට පටහැනි ලෙස ප්‍රධාන ලේකම් වැය ශීර්ෂය යටතේ ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඍජු ප්‍රදාන ලබා දීම වෙනුවෙන් එකතුව රු.1,403,603 ක් වැය කර තිබුණි. ඒ යටතේ වූ ව්‍යාපෘති 02 ක දී එකතුව රු.395,200 ක් ගෙවා සෙවිලි තහඩු 208ක් මිල දී ගෙන ඒවා විහාරස්ථාන 02 ක් වෙත ලබා දීමට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පියවර ගෙන තිබුණද, සෙවිලි තහඩු ලබාදුන් බවට දක්වා තිබුණු විහාරස්ථාන 2015 මාර්තු 20 දින භෞතිකව පරීක්ෂා කිරීමේ දී ඒවා කිසිවක් එදින වන විටත් ලැබී නොතිබුණි. එසේ වුවද, එම භාණ්ඩ 2015 ජනවාරි 12 දින විහාරාධිපති ස්වාමීන්වහන්සේ විසින් භාරගත් බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලේඛන අනුව තහවුරු විය.

(ආ) අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී රු.3,507,669ක් වැය කරමින් සිදුකල වියට්නාම අධ්‍යාපන චාරිකාව සඳහා සේවා සැපයුම්කරු තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව නොසැලකිලිමත්ව කටයුතු කිරීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු.220,770 ක අලාභයක් සිදුවී තිබුණි. තවද, 5 වසර ශිෂ්‍යත්වය සමත් සිසුන් 12 දෙනෙකු මෙම චාරිකාවට සහභාගී කරවීමට නියමිතව තිබිය දී ඒ සඳහා සහභාගී නොවූ සිසුන් 05 දෙනා වෙනුවට ඊලඟ වැඩිම ලකුණු ලබාගත් දරුවන් 05 දෙනෙකුට එම අවස්ථාව ලබාදීම කෙරෙහි කිසිදු අවධානයක් යොමුකර නොතිබූ අතර, සහභාගී වූ සිසුන් 07 දෙනෙකු වෙත ගෙවා තිබූ එකතුව රු. 50,555 ක් වූ දීමනාව 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට හා පළාත් ප්‍රධාන ලේකම්ගේ 2014 නොවැම්බර් 24 දිනැති අංක DCS/PT/DO/03/07 දරණ ලිපියේ උපදෙස්වලට පටහැනි විය.

(ඇ) 2009 ජුනි 08 දින සිට ප්‍රධාන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇති රියදුරකු වෙනුවෙන් 2009 ජුනි මස සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාල සීමාව වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.1,221,032 ක් ගෙවීම් කර තිබුණි.

**6.7 දෘශ්‍ය අක්‍රමිකතා**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන Electronic Internal Morbidity & Mortality Register (EIMMR) ව්‍යාපෘතිය සඳහා සහ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතා වෙනුවෙන් එකතුව රු.23,482,000 ක් වැය කර පරිගණක යන්ත්‍ර 236 ක් මිල දී ගැනීමේ දී තාක්ෂණික පිරිවිතර සැකසීම, තාක්ෂණික ඇගයීම් සිදු කිරීම සහ පිරිවිතර පරීක්ෂා කර භාණ්ඩ භාරගැනීම යන ක්‍රියාවලින් වංචනික ස්වරූපයෙන් ඉටු කිරීම හේතුවෙන් සැපයුම්කරු වෙත පළාත් සභා අරමුදලින් රු.2,153,500 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් අධ්‍යාපන පද්ධතිය දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පරිණාමය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදුකරන මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 09 ක් සඳහා තොරතුරු තාක්ෂණ ආශ්‍රිත උපකරණ හා විද්‍යාගාර ගෘහ භාණ්ඩ සපයා ගෙනෙවිත් භාරදී ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් එකතුව රු. 60,372,500 ක මුදලක් වැයකර පරිගණක 589 ක් මිලදී ගෙන තිබුණි. එහි දී තාක්ෂණික පිරිවිතර සැකසීම, තාක්ෂණික ඇගයීම් සිදුකිරීම සහ පිරිවිතර පරීක්ෂා කර භාණ්ඩ බාරගැනීම

වැනි ක්‍රියාවලීන් වංචනිකව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව ඉටු කිරීම හේතුවෙන් සැපයුම්කරු වෙත පළාත් සභා අරමුදලින් රු. 7,961,513 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

**6.8 වත්කම් කළමනාකරණය**

**6.8.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පළාත් සභාවට අයත් විවිධ ආයතනයන්හි පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වල දී නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව | වටිනාකම (රු.) | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් | 13 | - | අවුරුදු 09 |
| (ආ) | ගොඩනැගිලි | 15 | - | අවුරුදු 09 |
| (ඇ) | වාහන | 19 | - | අවුරුදු 10 |
| (ඈ) | යන්ත්‍රෝපකරණ | 14 | 809,886 | අවුරුදු 14 |
| (ඉ) | වෛද්‍ය උපකරණ | 14 | - | - |
| (ඊ) | කාර්යාල උපකරණ | 04 | - | - |

පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(අ) 1996 දෙසැම්බර් මස 04 වන දින කෑගල්ල සහකාර මිණුම් අධිකාරිගේ අත්සනින් සකස් කර තිබූ මැණුම් පත්‍ර අනුව භූමි ප්‍රමාණය අක්කර 106 රූඩ් 01 පර්චස් 11ක් වූ උඩුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ ඉඩමේ මායිම්, රජයේ මිනුම්දෝරුවරයෙකු විසින් ආයතනයේ නිලධාරීන් පස්දෙනෙකු ඉදිරියේ 2012 ජුනි 26 වන දින පෙන්වා දී තිබියදී, විගණිත දින වූ 2015 පෙබරවාරි 24 වන විටත් අදාල මායිම් සම්බන්ධකර ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබූ අතර මෙම භූමි ප්‍රමාණයට අදාලව අයිතිය සනාථ කිරීම සඳහා ඉඩමේ ඔප්පුවද සකස්කරගෙන නොතිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ වූ ආයතන වල තිබූ භාවිතා නොකරන (ක්‍රියාකාරි සහ අක්‍රිය) කාර්යාල උපකරණ , විද්‍යුත් උපකරණ සහ වෛද්‍ය උපකරණ 340 ක් අධිකාරි බලයක් නොමැතිව රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයා විසින් තම පෞද්ගලික අභිමතය පරිදි සෞඛ්‍ය ක්ෂේත්‍රයට හෝ සබරගමුව පළාත් සභාවට කිසිදු සම්බන්ධයක් නොමැති ආයතන වෙත ලබා දී තිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභා මුල්‍ය රීති අංක 476 ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ එකී දිනට ආසන්නව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කොට දෙපාර්තමේන්තු හෝ දෙපාර්තමේන්තු ශාඛාවන්හි ඇති භාණ්ඩ සමීක්ෂණයට භාජනය කළ යුතු වුවත්, නිවිතිගල කලාපයට අයත් පාසැල් 141 න් 2013, 2012 සහ 2011 වර්ෂයන් වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදු කළ පාසැල් සංඛ්‍යාව පිළිවෙලින් 20, 07 හා 03 ක් වූ අතර, කිසිදු වර්ෂයක දී භාණ්ඩ සමීක්ෂණය සිදු නොකළ පාසැල් ගණන 71 ක්ද 2005 වර්ෂයෙන් පසුව විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 12 දක්වා භාණ්ඩ සමීක්ෂණය සිදු නොකළ පාසැල් ගණන 33 ක් ද වශයෙන් අනාවරණය විය. තවද, ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපයට අයත් පාසල් 128 න් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණය සිදුකල පාසල් සංඛ්‍යාව පිළිවෙලින් 16, 27, 22, 03, 16 හා 14 ක් පමණක් විය.

(ඈ) රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ වන රෝහල් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ඇතුළු ආයතන 95 කින් ආයතන 91 ක් 2014 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයන් විගණිත දිනය වූ 2015 ජුනි 03 දින වන විටත් පවත්වා නොතිබුණු අතර, මෙම ආයතනවල පසුගිය වර්ෂවලට අදාල භාණ්ඩ සමීක්ෂණයන් පැවැත්වීම් ප්‍රමාදය වර්ෂ 01 සිට 16 දක්වා විය.

(ඉ) චන්ද්‍රිකා වැව ප්‍රාදේශීය රෝහලේ නේවාසික හදිසි අනතුරු රෝගීන් සඳහා 1998 මාර්තු 30 දින විවෘත කරන ලද නව ගොඩනැඟිල්ල විගණිත දිනය වූ 2015 අප්‍රේල් 10 දින වන විට සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත් කර තිබූ අතර, වහලයේ ඇතැම් ස්ථාන කඩා වැටීමෙන් සහ දොර ජනෙල් වීදුරු බිඳී ගොඩනැඟිල්ල ද විනාශවෙමින් පැවතුණි.

(ඊ) ර/ශ්‍රී වලගම්බා මහා විද්‍යාලයේ පරිගණක 12 ක් ක්‍රියා විරහිත තත්ත්වයේ පැවතුණු අතර, ඉන් පරිගණක 04 ක උපාංග කොටස් අස්ථානගත වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

## 6.9 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ දේශීය හා සෞඛ්‍ය හිතකර ආහාර වර්ග ප්‍රවර්ධනය සඳහා පවත්වාගෙන යනු ලබන සුවරස හල අවන්හල 2013 මාර්තු 12 දින දක්වා කොන්ත්‍රාත් පදනම මත රු.12,000 ක මාසික කුලියට ලබා දී ශුද්ධ ආදායමක් ලබමින් තිබූ නමුත්, ප්‍රධාන අමාත්‍යවරයාගේ තීරණයක් මත මේ වන විට එය ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන අවහන්හලක් බවට පත් කර තිබුණි. තවද, 2014 වර්ෂයේ ආදායම හා මුළු වියදම සලකා බැලූ විට රු.1,357,865 ක ශුද්ධ අලාභයක් වාර්තා වී තිබූ අතර, මෙම අවිධිමත් තීරණය මත පළාත් සභා අරමුදලට 2014 වර්ෂය තුළ දී රු.1,501,865 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් සබරගමුව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති ලෙස විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු පත්කොට 2014 පෙබරවාරි 03 දින සිට 2015 මාර්තු මස දක්වා මාසික දීමනා , ඉන්ධන හා දුරකථන දීමනා වශයෙන් එකතුව රු.775,999 ක් ගෙවා තිබුණ ද, එම ගෙවීම් 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරණ විශ්‍රාමික රජයේ නිලධාරින් නැවත සේවයේ යෙදවීම පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන පරිදි විශ්‍රාමික නිලධාරියෙකු අමාත්‍යාංශ ලේකම් හෝ සමාන තනතුරු සඳහා පත් කිරීම් වලට අදාල මාසික දීමනාවන් වන බැවින් ද, පුස්තකාලය ආරම්භ කර ඇත්තේ 2015 මාර්තු 31 දින බැවින් ද ඉහත ගෙවීම් පිළිබඳව විගණනයේ දී සෑහීමට පත් විය නොහැකි විය.

(ඇ) සබරගමුව පළාතේ සංවර්ධනය අරමුණු කොට, විදේශ රටවල් සම්බන්ධ කොට ගෙන විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් 06 ක් යටතේ 2011, 2012 සහ 2013 යන වර්ෂයන් හි දී අවස්ථා 10 ක දී එකතුව රු.8,966,481 ක වියදමක් දරා තිබුණ ද, 2014 අගෝස්තු 11 දින වන විට ද එම කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක තත්ත්වයක නොතිබුණි. ඒ ඒ සංවර්ධන වැඩසටහන් පිළිබඳව විගණනය විසින් පරීක්ෂා කිරීමේ දී එම ව්‍යාපෘති පිළිබඳව පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොමැති බවත්, ක්‍රියාත්මක කිරීමේ නිසි අධිකාරි බලයක් නොමැති බව පෙනී ගොස් තිබුණ ද, එම වැඩසටහන් යටතේ දිගින් දිගටම විදේශ සංචාරයන් සිදුකර තිබූ බව අනාවරණය විය. තවද, එම වැඩසටහන් 04 ක දී ප්‍රධාන අමාත්‍යවරයා දිවයිනෙන් බැහැරවීම සඳහා චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) විදේශ රටවල් වල ආරාධනයන් මත විවිධ ආගමික හා සංස්කෘතික වැඩසටහන් වෙනුවෙන් 2012 සහ 2013 යන වර්ෂයන් හි දී අවස්ථා 04 ක දී ප්‍රධාන අමාත්‍යතුමා සහ පෞද්ගලික ලේකම් විසින් පළාත් සභා අරමුදලින් රු.2,620,064 ක් වැය කරමින් විදේශ ගත වී තිබුණි.

(ඉ) 2014 වර්ෂය තුළ දී හිටපු ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය මගින් තිළිණ ලබා දීම වෙනුවෙන් රු.18,549,089 ක් වැයකර භාණ්ඩ මිල දී ගෙන තිබු අතර, එම මිල දී ගැනීම් වලදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4, 5.6, 7.8 හා 7.9 යන මාර්ගෝපදේශයන්ට පටහැනි ලෙස කටයුතු කර තිබුණි. අදාල සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ භාර ගැනීම හා ගෙවීම් කිරීම අවිධිමත් අයුරින් සිදුකර තිබු බවත් මෙම භාණ්ඩ හිටපු ආණ්ඩුකාරතුමා විසින් සිය අභිමතය පරිදි පෞද්ගලික තිළිණ වශයෙන් විවිධ පාර්ශවයන්ට බෙදා හැර තිබු බවත්, විගණනයේ දී අනාවරණය විය. තවද, මෙම භාණ්ඩ කුමන පාර්ශවයන්ට බෙදා හැර තිබේ ද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය විසින් 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දහම් පොත් ඇතුළු මුද්‍රිත පොත් මිල දී ගැනීම සඳහා ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ එකතුව රු.23,860,187 ක් ද අයභාර වැය විෂයයන් යටතේ එකතුව රු.18,115,855 ක් ද වැය කර තිබුණි. එම වැය විෂයයන්ගෙන් වැය විෂයන් 08 ක් සම්බන්ධයෙන් වාර්ෂික ඇස්තමේන්තුවල අදාල ප්‍රමිත වැය විෂය විස්තරයට පටහැනි ලෙස පොත් මිල දී ගැනීම සඳහා රු.35,183,362 ක් වැයකර තිබුණු අතර, අසාමාන්‍ය ලෙස විවිධ වැය විෂයන්ට විශාල ලෙස ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් හෝ පිළියෙල කර නොතිබු බවත් 2015 ජනවාරි 30 දින වන විටත් පොත් 58,384 ක් පමණ කිසිදු පාර්ශවයකට බෙදා නොතිබු බවත් විගණනයේ දී අනාවරණය විය.

(උ) මෝටර් වාහන පනත (200 වන අධිකාරිය) සාදන ලද නියෝග අනුව ලියාපදිංචිය සඳහා වන සුදුසුකම්, රිය පැදවීමේ පාසැලක ප්‍රගතිය , රිය පැදවීමේ උපදේශකයන් සතුවිය යුතු සුදුසුකම් හා රිය පැදවීමේ පාසැල් විසින් යොදා ගන්නා වාහනවල යෝග්‍යතාව පිළිබඳ නිශ්චිත පැහැදිලි කිරිම් දක්වා තිබු අතර, යම් ලෙසකින් එම නියෝගවලට අනුකූලව කටයුතු නොකරන යම් පාසැලක හෝ උපදේශකවරයෙකුගේ බලපත්‍රයක් අවලංගු කිරීමේ බලය මෝටර් වාහන කොමසාරිස්වරයාට ලබා දී තිබුණි. එසේ තිබිය දී, එම නියෝග පරිදි සුදුසුකම් තීරණය කර රිය පැදවීමේ පුහුණු පාසැල් තෝරා ගැනීම වෙනුවට එම විධිවිධාන වලට පටහැනිව සබරගමුව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) විසින් නව සුදුසුකම් තීරණය කර, ඒ අනුව පුහුණු පාසැල් තෝරා ගැනීම නිසා අවම මිල මත ප්‍රසම්පාදනය පිරිනැමීමට හැකි වී නොතිබුණි. මේ නිසා රු.167,750 ක පාඩුවක් සිදු වී තිබුණු අතර, එම මුදලින් තවත් විසි දෙදෙනෙකුට රියදුරු බලපත්‍ර ලබා දීමට තිබුණු අවස්ථාව ද අහිමි වී තිබුණි. එමෙන් ම, මෝටර් වාහන නියෝග හා ඒ මත මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගේ බල සීමාවන් ඉක්මවා යන පරිදි අතිරේක සුදුසුකම් නියම කිරිම ද විගණනයේ දි ගැටළු සහගත විය.

**6.10 නිශ්කාර්ය වියදම්**

සබරගමුව පළාත් සභාවේ ආදායම් ජනනය හා ප්‍රවර්ධනය සඳහා වු විශේෂ ස්ථාවර කමිටුව පිහිටුවා වසර 2 කට අධික කාලයක් ගත ව ඇතත් එහි අරමුණු වලින් කිසිවක් ඉටු වී නොමැති බව කමිටු රැස්වීම් වාර්තා හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය වසරවල ආදායම් රැස්කිරීම් ප්‍රගතිය පිළිබඳව පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය . එහෙත් 2013 පෙබරවාරි සිට 2015 මාර්තු 31 දක්වා වූ කාල සීමාවට අදාළව මෙම කමිටු සාමාජිකයන් වෙත සහභාගීත්ව දීමනා , මාසික දීමනා හා දිරි දීමනා වශයෙන් එකතුව රු. 1,390,095 ක්

ගෙවා තිබූ අතර, කමිටුවේ ලේකම්වරයා පත් කිරීමේ දී විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2007 මැයි 11 දිනැති අංක 2007/09 හා 2007 අගෝස්තු 24 දිනැති අංක 2007/09(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව කටයුතු කර තිබුණි.

**6.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රජාපාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් චක්‍රලේඛයේ 3.2 වගන්තියේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව 3.4 වගන්තිය අනුව ප්‍රජාපාදක සංවිධානයේ/ සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුලට අදාල වූ කොන්ත්‍රාත් පමණක් පැවැරිය යුතුව තිබුණි. පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිකිරීම් කොන්ත්‍රාත් 18 ක් ප්‍රජාපාදක සමිති වලට පැවරීමේ දී එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාර අදාල කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත වටිනාකමට සමාන වූ පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගත යුතු වුවද, අමාත්‍යාංශ දෙකක් විසින් සමාලෝචිත වර්ෂයේ දි හා පෙර වර්ෂයන්හි දී ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එවැනි රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබීම නිසා එක් අවස්ථාවක දී ස්වභාවික උවදුරක් හේතුවෙන් හානියට පත් වූ ඉදිකිරීමක් නැවත යථාතත්ත්වයට පත් කිරීම සඳහා ඉඩම්, පළාත් වාරි මාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් රු.2,624,873 ක් වැය කර තිබුණි.

(ඇ) පළාත් අමාත්‍යාංශ 02 ක් විසින් ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් කර්මාන්ත 05 ක් සම්බන්ධයෙන් එකතුව රු.792,090 ක් වූ ප්‍රමාද ගාස්තු අයවිය යුතුව පැවති අතර, ඉදිකිරීම් කර්මාන්ත 04 ක් සම්බන්ධයෙන් ඉටු නොකරන ලද අයිතමයන් 09 ක් සඳහා එකතුව රු.157,557 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් 2014 වර්ෂය තුළ දී පුරන්වී ඇති කුඹුරු වගා කටයුතුවලට යොදා ගැනිම අරමුණු කොට එකතුව රු.2,009,519 ක් වැය කරමින් ඉදිකර තිබූ කෘෂිකාර්මික ව්‍යාපෘති 05 ක් සම්බන්ධයෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොමැති බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ඉ) බඹරදෙන වැව සකස් කිරීමේ කර්මාන්තය සඳහා වූ සක්‍යතා වාර්තාව සකස් කිරීමේදී අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර වගා අක්කර 30කට ජලය සපයමින් පවතින බවත් ව්‍යාපෘතියේ වැඩ අවසන් වූ පසු තවත් අක්කර 15ක් සඳහා ජලය සැපයීම සිදුකල හැකි බවත් සඳහන් කරමින් රු.520,000ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. 2014 සැප්තැම්බර් 17 වන දින විගණනය විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී වැවේ එකතුවන ජලය වගාවන්ට ලබාගැනීමට ඇලමාර්ගයක් නොතිබීම සහ වැවෙන් පිටවන ජලය කිසිදු වගා කටයුත්තක් සිදුකල නොහැකි තද බෑවුමක් සහිත සන කැලයක් දෙසට පිටවන බවත්, රු.361,059ක් වැයකර

නිමකර තිබූ මෙම කර්මාන්තය සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට ව්‍යාජ තොරතුරු සපයා තිබූ බවත් විගණනයට අනාවරණය විය.

(ඊ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේදී ජාතික සවිය ගම නැගුම විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ ලබාදෙන ලද රු.11,000,000 ක ප්‍රතිපාදන මත පළාත් ඉඩම් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් රු.8,793,408 ක වටිනාකමකට ගිවිසුම්ගතව තිබූ ගල්බොකුඹය වැව ප්‍රතිසංස්කරණය සඳහා වූ කර්මාන්තයට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තියට පටහැනි ලෙස ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම සිදු නොකර ප්‍රසම්පාදන කමිටු නිර්දේශය මත සීමිත මිල කැඳවීමක් මඟින් උක්ත කර්මාන්තය ප්‍රදානය කර තිබුණි. තවද, 2012 අප්‍රේල් 15 දින (නඩත්තු කාලය තුළ) මෙම ඉදිකිරීමට අදාල ප්‍රධාන බැම්මට සම්බන්ධ එක් ආධාරක බැම්මක් කඩා වැටීම සම්බන්ධයෙන් පත් කර තිබූ පරීක්ෂණ කමිටුවේ වාර්තාව අනුව, අදාල වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) 2012 ඔක්තෝබර් 22 වන දින රු.925,000ක් වටිනාකමැති ගිවිසුමකට එළඹ වැඩ ආරම්භකර තිබූ පදලංගල ජල ව්‍යාපෘතිය 2013 වර්ෂයේ විගණනයෙන් පරීක්ෂා කරන විට වැඩ අතරමග නවතා දැමීම සම්බන්ධයෙන් යොමුකරන ලද විගණන විමසුමට ලබාදී තිබූ පිළිතුර මඟින් ව්‍යාපෘතියේ වැඩ 2014 මැයි 12 වන දින වන විට නැවත ආරම්භ කර ඇති බවත්, එය ඵලදායී ව්‍යාපෘතියක් බවට පත්කරන බවත් වාර්තා කර තිබුණද, 2014 නොවැම්බර් 18 වන දින සිදුකල නැවත පරීක්ෂාවේදී ව්‍යාපෘතියේ ඉටුකර තිබූ වැඩ වල කිසිදු ප්‍රගතියක් ලබා නොතිබූ බව තහවුරු විය.

(ඌ) පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කර්මාන්තය | ගිවිසුම්ගත වටිනාකම | ක්ෂේත්‍ර පරීක්ෂණ කළ දිනය | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|---|---|---|
| | | | රු. | | |
| i. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | උඩුගොඩ ගොවිපලේ අංක 04 නිල නිවස අළුත්වැඩියා කිරීම | 829,501 | 2015.02.06 | වැඩ විෂයයන් 06 ක් ඇස්තමේන්තුව පරිදි නිසි ප්‍රමිතියෙන් තොරව ඉටු කිරීම |
| ii. | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | රුවන්වැල්ල පශු වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිල නිවාසය අළුත්වැඩියා කිරීම | 773,722 | 2015.02.27 | වැඩ විෂයයන් 04 ක් නිසි ප්‍රමිතියෙන් තොරව ඉටු කිරීම ඇස්තමේන්තු නොකරන ලද අයිතමයන් ඉටු කිරීම |
| iii. | --එම-- | ගෝනකුඹුර ඉහල ශ්‍රී මුන්දන් කෝවිල ඉදිකිරීම II අදියර | 875,000 | 2014.11.19 | බිත්ති හතරක ස්ථාන 07 ක් පුපුරා තිබීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| iv. | --එම-- | වැලි කුඹුර හේන පන්සල පාර කොන්ක්‍රීට් කිරීම | 1,571,673 | 2014.12.09 | කොන්ක්‍රීට් තලය පුරාවටම උස් පහත් ස්ථාන පැවැතීම. |
| v. | --එම-- | කඳන්ගොඩ පැතුම් උයන මාර්ගයේ ආරම්භක කොටසේ පැති බැම්ම ඉදිකිරීම | 1,204,834 | 2014.12.10 | සක්ක ගල් බැම්ම ස්ථාන දෙකක පුපුරා යෑම. |

## 6.12 ප්‍රමාද වූ ව්‍යාපෘති/ සම්පූර්ණයෙන් අත්හැර දැමූ ව්‍යාපෘති

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 04 ක් විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් 11 ක් විවිධ හේතූන් නිසා ප්‍රමාදවී තිබූ අතර, අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 02 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් 72 ක් ආරම්භ නොකර සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

## 6.13 කාර්ය මණ්ඩල පරිපාලනය

### 6.13.1 අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාතේ පාසල් වල වර්තමාන ගුරු අවශ්‍යතාවයන් සලකා සකස් කර තිබූ යෝග්‍ය ගුරු සංඛ්‍යාව සමඟ සැසඳීමේදී විවිධ විෂයයන් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි ගුරු ඌනතා සහ අතිරික්තතා පැවැතුණි.

**6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා**

| විෂයය | ඌනතාවය | | අතිරික්තය | |
|---|---|---|---|---|
| | කළාප සංඛ්‍යාව | ගුරු භවතුන් සංඛ්‍යාව | කළාප සංඛ්‍යාව | ගුරු භවතුන් සංඛ්‍යාව |
| ඉංග්‍රීසි | 04 | 56 | 03 | 66 |
| තාක්ෂණ විෂයය | 01 | 23 | 06 | 207 |
| වෙනත් විෂයයන් | 01 | 10 | 06 | 633 |

**12 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා**

| විෂයය | ඌනතාවය | | අතිරික්තය | |
|---|---|---|---|---|
| | කළාප සංඛ්‍යාව | ගුරු භවතුන් සංඛ්‍යාව | කළාප සංඛ්‍යාව | ගුරු භවතුන් සංඛ්‍යාව |
| විද්‍යා හා අතිරේක විෂයයන් | 04 | 17 | 03 | 34 |
| කලා- වාණිජ විෂයයන් | 04 | 125 | 03 | 53 |
| තාක්ෂණ විෂයයන් | 03 | 07 | 03 | 14 |

පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක ඊඩී/1/27/1/5/1/2007 දරණ චක්‍රලේඛයේ 3.2 වගන්තිය මගින් වඩාත් පහසු පාසලක අවුරුදු 06 ක් සහ පහසු පාසලක අවුරුදු 08 ක් වශයෙන් උපරිම සේවා කාලය තීරණය කර තිබුණි. එසේ වුවත්, රත්නපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 02 ක පාසල් 179 ක ගුරුභවතුන් 913 දෙනෙකු වසර 09 සිට වසර 35 දක්වා වූ කාල පරිච්ඡේදයක් ද කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල කලාපයේ ගුරු භවතුන් 101 දෙනෙක් වසර 20 සිට වසර 35 දක්වා වූ කාල පරිච්ඡේදයක් ද එකම පාසලේ සේවය කරමින් තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1.2 හා 2.1.3 වගන්ති ප්‍රකාරව විෂය ඉගැන්වීමේ නියුක්ත ගුරු භවතුන් සතියකට සාමාන්‍යයෙන් විනාඩි 40 ක කාලච්ඡේද 35 ක් ද විෂය ඉගැන්වීමට අමතරව පංති භාරව සිටින ගුරුභවතුන් සතියකට අවම කාලච්ඡේද 33 ක් ද, උසස් පෙළ ගුරුභවතුන් සතියට කාලච්ඡේද 30 ක් ද, ඉගැන්වීමේ නිරත විය යුතු විය. එසේ වුවත්, රත්නපුර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 03 ක පාසල් 04 ක් විසින් ඊට පටහැනිව කාලච්ඡේද වෙන් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දී ගුරුභවතුන් 80 දෙනෙක් කාලච්ඡේද 15044 ක් එනම් පැය 10028 ක් අධ්‍යයන කටයුතු වලින් පරිබාහිරව නිෂ්කාර්යව සිට ඇති බව විගණනයේ දි අනාවරණය විය. තවද, මාවනැල්ල අධ්‍යාපන කළාපයේ සුජාතා කණිෂ්ඨ විද්‍යාලයේ 06 සිට 11 ශ්‍රේණි සඳහා ගුරු භවතුන් 47 දෙනෙකු සතියක කාලපරිච්ඡේද 19 සිට 33 දක්වා පමණක් ඉගැන්වීම් කටයුතු වල යෙදි තිබුණි.

(ඇ) කෑගල්ල අධ්‍යාපන කලාපයට අයත් නාගරික පාසල් 14 ක ගුරුභවතුන් 113 දෙනෙකුගේ අතිරික්තයක් ද ග්‍රාමීය පාසල් 13 ක ගුරුභවතුන් 64 දෙනෙකුගේ ඌනතාවයක් ද පැවතුණු අතර, කලාප අධ්‍යාපන කාර්යාලයේ සංවර්ධන නිලධාරි සේවයේ 31 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඈ) මාවනැල්ල අධ්‍යාපන කලාපයට අයත් පළාත් සභා පාසල් 140 සඳහා අනුමත ගුරුභවතුන්ගේ සංඛ්‍යාව 2555 ක් වුවත්, ඒ සඳහා ගුරුභවතුන් 2848 දෙනෙකු අනුයුක්ත කිරීමෙන් ගුරු භවතුන් 290 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණ ද අවිධිමත් අනුයුක්ත කිරීම් හේතුවෙන් පාසල් 46 ක ගුරු භවතුන් 120 දෙනෙකුගේ ඌනතාවයක් ද පැවැතුණි. තවද, පහසුකම් සහිත නාගරික පාසල්වලට එක් එක් විෂය ධාරාවන් යටතේ ද අනුමත සංඛ්‍යාව ඉක්මවා දෙගුණයක් අනුයුක්තව සිටි අතර, පහසුකම් අඩු ග්‍රාමීය පාසල්වලට එකී විෂය ධාරාවන් සඳහා අනුමත සංඛ්‍යාව හෝ අනුයුක්ත කර නොතිබුණි.

(ඉ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ සුජාතා කනිෂ්ඨ විද්‍යාලයේ ගුරු සේවයේ දෙදෙනකු අධ්‍යයන කටයුතු සඳහා නිදහස් කර තිබුණ ද , එම ගුරු භවතුන් දෙදෙනා ඉගැන්වීම් සිදුකළ 7 -11 ශ්‍රේණිවල අදාල කාල පරිච්ඡේද වෙනත් ගුරුභවතුන්ගෙන් ආවරණය කර නොතිබුණි. එසේම, ගුරුභවතුන් 47 දෙනෙකු 2014 වර්ෂය තුළ දි නොදන්වා සේවයට වාර්තා කර නොතිබු අතර, එම ගුරුභවතුන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 07 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) පින්නවල දෙමළ මහා විද්‍යාලයේ සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් එහි විදුහල්පති සහ නියෝජ්‍ය විදුහල්පති චූදිතයන් ලෙස හඳුනාගෙන මූලික විමර්ෂණ වාර්තාව 2008 මාර්තු 19 දින පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂක වෙත භාර දි තිබුණි. එම වාර්තාව අනුව විධිමත් විනය පරික්ෂණයක් පැවැත්විය යුතු වුවද එසේ සිදුකල බවට සාක්‍ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතරම මූලික විමර්ෂණ වාර්තාවේ නිර්දේශ මත ගුරුභවතුන් 07 දෙනෙකු වෙත ලිඛිතව අවවාද කල යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි.

6.13.2 **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා**

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එක් එක් සේවාවල සේවක අතිරික්තය හෝ ඌනතාවය, විවිධ ආයතන මට්ටමින් පහත දැක්වේ.

| | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | | රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | | කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් රෝහල් | |
|---|---|---|---|---|---|---|
| | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය | අතිරික්තය | ඌනතාවය |
| වෛද්‍ය | - | 08 | - | 137 | - | 50 |
| හෙද | - | 01 | - | 111 | 23 | 17 |
| ඖෂධවේදී | - | 02 | - | 09 | - | 11 |
| මහජන සෞඛ්‍යපරීක්ෂක | - | - | - | 36 | - | 09 |
| පවුල් සෞඛ්‍ය සේවක | - | - | - | 165 | - | 93 |
| ඖෂධ සංයෝජක | - | - | - | 51 | - | 30 |
| උපස්ථායක | - | - | - | 83 | - | 45 |
| රියදුරු | - | - | - | 21 | - | 17 |
| අරක්කැමි | - | - | - | 22 | - | 12 |
| මුරකරු | - | - | - | 51 | - | 20 |
| මෝවරි කම්කරු | - | - | - | 54 | - | 30 |
| ගණකාධිකාරි | - | 03 | - | - | - | 02 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පි | - | - | - | 20 | - | 07 |
| කළමනාකරණ සහකාර | - | 25 | - | 18 | - | 13 |
| සංවර්ධන නිලධාරි | - | 22 | 06 | 24 | 23 | - |
| සෞඛ්‍ය කාර්ය සහයක | - | 04 | 22 | 56 | 161 | 44 |
| මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි | - | - | - | 11 | 12 | - |
| | - | --- | --- | ---- | ---- | ---- |
| එකතුව | - | 65 | 28 | 869 | 219 | 400 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(අ) මාවනැල්ල, වරකාපොල, කරවනැල්ල යන මූලික රෝහල් තුනෙහි අනුමත හෙද කාර්ය මණ්ඩලය 345 දෙනෙකු වුවත්, ඒ සඳහා 363 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, ග්‍රාමීය රෝහල් 11 ක අනුමත හෙද කාර්ය මණ්ඩලය 26 දෙනෙකු වුවත්, එකදු හෙද නිලධාරියෙකු හෝ අනුයුක්ත කර නොතිබුණි. තවද, කෑගල්ල දිස්ත්‍රික්කයේ මධ්‍යම බෙහෙත් ශාලා 22 ක වෛද්‍ය හා හෙද තනතුරු හැර අනෙකුත් සේවා සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 36 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා තිබුණි.

(ආ) වාට්ටු 04 ක් සහිත බෙලිගල ග්‍රාමීය රෝහලේ සියලු සේවා කාණ්ඩ වලට අදාල අනුමත කාර්ය මණ්ඩලය 33 දෙනෙකු වුව ද, තත්‍ය කාර්ය මණ්ඩලය 06 දෙනෙකු විය.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ පවත්නා තනතුරු 07 ක් සම්බන්ධයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින රෝහල් හා අනෙකුත් ආයතනයන්හි 65 දෙනෙකුගේ අතිරික්තයක් හා 80 දෙනෙකුගේ ඌනතාවයක්

පවතින බව නිරීක්ෂණය වු අතර, ඉන් ඌනතාවයන් 25 ක් අතිරික්ත සංඛ්‍යාවෙන් හිලව් කිරීමට හැකියාව තිබිය දී ඒ ආකාරයට කටයුතු කර නොතිබුණි.

**6.14 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරුනු ලැබේ.

(අ) 2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරණ රාජ්‍ය වියදම් කළමනාකරණය චක්‍රලේඛයේ සහ 2006 ඔක්තෝබර් 23 දිනැති අංක සීඑස්ඒ/පී1/40 දරණ අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයාට නිල වාහන දෙකක් සහ එක් ආරක්ෂක රථයක් පමණක් වෙන් කළ යුතුව තිබුණි. එසේ වුවත් එම විධිවිධාන වලට පටහැනිව 2013 සහ 2014 වර්ෂයන් හි දී වාහන 12 ක් ප්‍රධාන අමාත්‍යවරයා විසින් භාවිතා කර තිබු අතර, එම වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.3,030,297 ක් වැය කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දි ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරින් තිදෙනෙකු විසින් සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන පුද්ගලයින් දෙදෙනකු විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරි ලෙස දක්වමින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව හා රහිතව සංචිත වාහන 04 ක් භාවිතා කර තිබු අතර, ඒ සඳහා ඉන්ධන වෙනුවෙන් රු.692,516 ක් වැය කර තිබුණි.

(ඇ) පළාත් පාලන දෙපාර්තමේන්තු සතු ජීප් රථයක් 2012 නොවැම්බර් 27 දින නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට අළුත්වැඩියා කටයුතු සඳහා භාර දී තිබු අතර, විගණිත දිනය වු 2015 මාර්තු 23 දින වන විටත් එම වාහනය අළුත්වැඩියා කිරීමක් හෝ ඒ සම්බන්ධයෙන් ගතයුතු වෙනත් ක්‍රියා මාර්ගයක් හෝ ගෙන නොතිබුණි.

**6.15 බැංකු සැසඳුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාස 06 ක කාලයක් ඉක්මවා නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු.2,642,338 ක් වූ චෙක්පත් 204 ක් සම්බන්ධයෙන් සබරගමුව පළාත් මූල්‍ය රීති 283.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතුව රු.451,012 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 16 කට අදාල හඳුනා නොගත් හර කිරීම්වල එකතුව රු.26,908,423 ක් වූ අතර, බැංකු ගිණුම් 16 කට අදාලව හඳුනා නොගත් බැර කිරීම්වල එකතුව රු. 110,931,465 ක් විය.

**6.16 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ අරමුණු**

පරිවාස හා ළමාරක්ෂක ක්ෂේත්‍රය තුලින් ඉටු විය යුතු මුලික අරමුණ වනුයේ සමාජයීය වශයෙන් අසාධාරණයට පත් වු ළමුන් ආයතනගත කිරීම හරහා යහපත් පුරවැසියන් ලෙස යලිත් සමාජගත කරවීම වනඅතර, පරිවාස භාරයේ සිටින ළමුන්ගේ දෛනික අවශ්‍යතා හා සුභසාධනය මෙන්ම අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කිරීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා වැදගත් වන ළමුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය සංවර්ධනයට අදාල වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, දැනුම හා හැකියා වර්ධනය තුලින් වෘත්තිමය පුහුණුවක් ලබාදීම වැනි අංශ කෙරෙහි දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය කෙරේ.

**07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**7.1 ක්‍රියාකාරී සැලැස්ම**

දෙපාර්තමේන්තු 04 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**7.2 අභ්‍යන්තර විගණනය**

සමලෝචිත වර්ෂය තුළ දී එක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 07 ක් අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

**7.3 විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 12 ක් සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටුවක් බැගින් ද දෙපාර්තමේන්තු 10 ක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 බැගින් ද පවත්වා තිබූ අතර, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 05 ක් සම්බන්ධයෙන් එකදු කමිටුවක් හෝ පවත්වා නොතිබුණි.

**7.4 ප්‍රසම්පාදන සැලැස්ම**

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 04 ක් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**7.5 අයවැය ලේඛනමය පාලනය**

ආදායම් සංකේත 4 කට අදාලව සමාලෝචිත වර්ෂයේ ආදායම ඇස්තමේන්තු කිරීමේ දි , 2013 වර්ෂයේ තත්‍ය ආදායම කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක්වා එකතුව රු.169,910,996 ක් අඩුවෙන් ආදායම ඇස්තමේන්තු කර තිබුණි. තවද, එම සියළු ආදායම් සංකේත වල 2013 වර්ෂයේ තත්‍ය ආදායම 2012 වර්ෂයේ තත්‍ය ආදායමට වඩා වැඩි වී තිබුණි.

**7.6 නොවිසඳී ඇති විගණන ඡේද**

පළාත් ගිණුම් කාරක සභාවේ සාකච්ඡා කරන ලද 2001 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ට අදාළ විගණකාධිපති වාර්තාවන්හි ඇතුලත් දෙපාර්තමේන්තු 02 කට අදාල විගණන ඡේද 24 ක් සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

**08. පද්ධති හා පාලනය**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මුල්‍ය පාලනය.
(ආ) වත්කම් හා මානව සම්පත් පාලනය.
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
(ඉ) පාසල් කළමනාකරණය.
(ඊ) රෝහල් කළමනාකරණය.